# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No } 10120

2171635

ෆැක්ස්
தொலைநகல
Fax } 011-

දුරකථන
தொலைபேசி
Telephone } 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site } www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail } dir.media@police.gov.lk


---

මගේ අංකය
எனது இலக்கம்
My NO } 1560 /2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No } / 2024

දිනය
திக
Date } 09/10/2024 පැය 1315

**මාධ්‍ය නිවේදනය**

**වීසා නොමැතිව රැඳී සිටි චීන ජාතිකයින් පිරිසක් අත්අඩංගුවට - පානදුර උතුර පොලිස් ස්ථානය.**

2024.10.08 වන දින සවස් කාලයේ ගොරකාන, කෙසෙල්වත්ත ලිපිනයේ පිහිටි හෝටලයක සැකකටයුතු ලෙස විදෙස් ජාතිකයින් පිරිසක් රැඳී සිටින බවට පානදුර උතුර පොලිස් ස්ථානය වෙත ලද තොරතුරකට අනුව අදාල ස්ථානය පරික්ෂා කර එහි වීසා නොමැතිව රැඳී සිටි විදෙස් ජාතිකයින් 20 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 22 ත් 49 ත් අතර වයස්වල පසුවන චීන ජාතිකයින් පිරිසකි.**

ඔවුන් සන්තකයේ තිබී **ජංගම දුරකථන 442 ක් , චාජර් 140 ක්, රවුටර් 19 ක්, පරිගණක 03 ක්, ලැප්ටොප් 09 ක් මොනිටර් 03 ක්, වීඩියෝ කැමරා 02 ක්, සිම් කාඩ් 115, ප්‍රින්ටර් 01ක්, USB Cable 367 ක්, CCTV කැමරා 02 ක්, Network Cable 22 ක්, පවර් කෝඩ් 16, ක් සහ ගණක යන්ත්‍ර 03 ක්** විමර්ශන නිලධාරින් භාරයට ගෙන ඇත.

2024.10.06 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හංවැල්ල පොලිස් වසමේදී අන්තර්ජාලය ඔස්සේ සංවිධානාත්මක ලෙස මුදල් වංචා සිදු කල බවට සැකපිට අත්අඩංගුවට ගත් චීන ජාතික පිරිස හා ඉහත අත්අඩංගුවට ගත් චීන ජාතිකයින් පිරිස අතර සම්බන්ධතාවයක් තිබේද යන්න පිළිබඳ විමර්ශන සිදු කරමින් පවතී.

පානදුර උතුර පොලිසිය හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**